# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,279 — 1962 අගෝස්තු 31 වැනි සිකුරාද — 1962.8.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 1245 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1246 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1246 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 1247 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | 1247 |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1247 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1253 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | 1254 |


[මේවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ලියා පදිංචි කළ ආයුර්වේද වෛද්‍ය නාම ලේඛනය අඩංගුවේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 358**

අංකය: ඩී/වීඑෆ්/10/ඒ.

**යුද්ධ හමුදාව—ලංකා සෙවච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උප සේවයට මාරුකිරීමක්**

1962 ජූනි මස 1 වැනි දින සිට, ලංකා යුද හමුදා වෛද්‍ය බලකායේ (ස්වේ.) උප සේවයට මාරුකිරීම :—

මේජර් ඕබ්‍රි ස්ටැනිස්ලෝස් අවුවස්කුන්, ල. යු. වෛ. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 12 වෙනිදා,
කොළඹදීය.

8-1045

**1962 අංක 359**

අංකය: ඩී. 153/රෙක්ට්.

**යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම් සඳහන් නිලධාරියා 1962 අගෝස්තු මස 15 වැනි දින සිට විශ්‍රාම ගනී :—

කපිතාන් (තාවකාලික මේජර්) කොළඹගේ දොන් ඩේවිඩ් වීරසිංහ, ල. වි. යා. ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 17 වෙනිදා,
කොළඹ දී ය.

8-1157

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 360**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය :—

ඒ. 236/62.

1962 ජූලි මස 28 වැනි දින සිට සිවිල් සේවක ආර්. ඇල්. ආර්නෝල්ඩ් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළදී හෝ නැවත නියමයක් කරන තුරු හෝ නියෝජ්‍ය ආහාර කොමසාරිස් සිවිල් සේවක එම්. සිවනාදන් මහතා සවකීය රාජකාරිවලට අතිරේකව ආහාර කොමසාරිස්, ආහාර සැපයීමේ අධ්‍යක්ෂ, ආහාර පාලක සහ මිල (ආහාර) පාලක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 132/62.

1962 ජූලි මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සොලිසිටර් ජනරාල් ඒ. සී. අලස් මහතා සවකීය රාජකාරිවලට අතිරේකව අල්ලස් කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 199/62.

1962 ජූනි මස 20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අරමුණු ඉංජිනේරු ඇම්. මුතුබාලසූරියර් මහතා එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු සහ නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු වශයෙන් වැඩ බැලීමට.

ඒ. 202/62.

1962 ජූනි මස 29 වැනි දින සිට සිවිල් සේවක ඇන්. බී. ඇම්. සෙනෙවිරත්න මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළදී හෝ නැවත නියමයක් කරන තුරු හෝ සිවිල් සේවක ඇම්. ජේ. ඇම්. මුෂීන් මහතා වවුනියාව පාලන දිස්ත්‍රික්කය භාර දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 223/62.

1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක වී. රාමනාදන් මහතා පුත්තලම පාලන දිස්ත්‍රික්කය භාර දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 82/62.

1962 අගෝස්තු මස 6 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඒ. බී. ඇල්කඩුව මහතා නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය භාර දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 222/62.

1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක කේ. බී. දිසානායක මහතා මාතලේ පාලන දිස්ත්‍රික්කය භාර දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 225/62.

1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එම්. එල්. ජේ. වික්‍රමරත්න මහතා අම්පාරේ පාලන දිස්ත්‍රික්කය භාර දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 221/62.

1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එම්. සෝමසුන්දරම් මහතා කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර දිසාපතිගේ විධානය පිට ක්‍රියා කරන එම දිස්ත්‍රික්කයේ උප දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 224/62.

1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එස්. එච්. එම්. ඉසෙඩ්. ෆාරුක් මහතා අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර දිසාපතිගේ විධානය පිට ක්‍රියා කරන එම දිස්ත්‍රික්කයේ අතිරේක උප දිසාපති වශයෙන් වැඩ බැලීමට.

ඒ. 185/62.

පොලිස් පරීක්ෂක ඒ. ඇම්. ඊ. ජයසේන, ඩී. ජී. සුරවීර, ටී. ඉසෙඩ්. ඒ. ආර්. අසන් සහ ඩී. පී. කරවිට යන මහත්වරු 1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සහකාර පොලිස් අධිකාරීන් වශයෙන්ද, පොලිස් පරීක්ෂක කේ. ඒ. සී. සී. විජේනායක, ටී. බී. තල්වත්තේ සහ ඩී. ඩී. විජේසිංහ යන මහත්වරු 1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සහකාර පොලිස් අධිකාරීන් වශයෙන් වැඩ බැලීමටද.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අගෝස්තු මස 27 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

8-1284

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 361**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 49/48.

එන්. සිවඥානසුන්දරම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අගෝස්තු 29 වැනි දින සිට, පේදුරු තුඩුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 6508 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, පේදුරුතුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 37/48.

එස්. ජෝකනාදන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අගෝස්තු 17 වැනි දින සිට, කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 14905, 14951 සහ 15030 දරණ නඩුවල තීන්දු දීමට, (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.57ඒ/57.

කේ. බී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 අගෝස්තු 18 වැනි දින සිට 20 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරණ පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 17සී/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. කුමාරසාමි මහතා 1962 අගෝස්තු 22 වැනි දින, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 58ඒ/59.

බී. සේනාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආසීර්වාදම් මහතා 1962 අගෝස්තු 27 වැනි දින, රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 අගෝස්තු 23 වැනි දින, 30 වැනි දින් සහ 31 වැනි දිනද 1962 සැප්තැම්බර් 1 වැනි දින සිට 11 වැනි දින දක්වා, ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උදලාගම මහතා 1962 අගෝස්තු 25 වැනි දින සිට 28 වැනි දින දක්වා, කෑගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 42සී/54.

ජී. සී. නයිල්ස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 අගෝස්තු 21 වැනි හා 22 වැනි දිනයන්හි, මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 3ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජී. එච්. සඳරත්න මහතා 1962 අගෝස්තු 28 වැනි දින සිට, (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආසීර්වාදම් මහතා 1962 අගෝස්තු 23 වැනි දින, රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 52බී/59.

එස්. සෙල්ලයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1962 සැප්තැම්බර් 1 වැනි දින සිට 5 වැනි දින දක්වා හා 12 වැනි දිනද, හලාවත, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 35බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 අගෝස්තු 25 වැනි දින, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : පීඑල්/එස්. 6/48.

ඊ. එම්. මතියපරනාම් සහ වී. සෝමසුන්දරම් යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 සැප්තැම්බර් 2 වැනි හා 3 වැනි දිනයන්හි, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පර නාදන් මහතා නැති අතර, පී. කුමාරනායගම් මහතා 1962 සැප්තැම්බර් 4 වැනි දින, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඒ. 23/57.

පී. ආර්. රාජේන්ද්‍රා මහතා 1962 අගෝස්තු 29 වැනි දින, පූලොලි ගම්බද උසාවියේ අංක 4882, 4883 සහ 4886/සීආර්එම් දරණ නඩු ඇසීමට, යාපනේ හා පෙදුරුතුඩුව දිස්ත්‍රික්කවල නැගෙනහිර හා උතුරු වලිකාමම්, වඩමරඩ්චි හා යාපනේ . ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයට.

අංකය : පීඑල්/එස්. 6/48.

වී. සෝමසුන්දරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1962 අගෝස්තු 28 වැනි දින සිට 30 වැනි දින දක්වා, වවුනියා හා යාපන දිස්ත්‍රික්කවල උතුරු වවුනියාවේ, මුහුදුබඩ පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ හා පූනකාරි-තුන්නුකායි, ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අගෝස්තු 27 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

8-1220

## වෙනත් පත් කිරීම් ආදිය

1962 අංක 362

අංකය : ජී. 25/43/64.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) ඩඩ්ලි ඩබ්ලිව්. ද ක්‍රෙට්සර් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(2) එම්. එස්. ගෆූර් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(3) ඒ. සී. එස්. සමරසේන මහතා, කොළඹ ගෙවල්කුලී පාලක මණ්ඩලයේ ලේකම් ධුරයේ වැඩබලන කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද, පත් කර ඇත්තේ ය.

1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ප්‍රකාශනයකින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍ය වරයා විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිව්රුම් පත්‍ර පිළියෙල කිරීමට අවශ්‍යවන සහතික කිරීම් හෝ දිව්රීම් හෝ කරවීමට විශේෂයෙන් බලය පවරා ඇති නිලධාරියෙකු වශයෙන් පී. ජයසේකර මහතා පොළොන්නරුවේ පිස්කල් මාර්ෂල් තැන වශයෙන් වැඩබලන කාලය තුළ පොළොන්නරුවේ අධිකරණ කොට්ඨාශය සඳහා 1962 අගෝස්තු මස 10 වෙනි දින සිට 22 වෙනි දින දක්වා පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-1277

## රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

1962 අංක 363

මෙහි පහත සඳහන් පත් කිරීම 1962.8.1 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත.

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු ටී. බී. හේරත් මහතා අනුරාධපුරයේ ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කායඝාලයේ සේවය කරමින් අනුරාධපුර පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1962 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දීය.

8-1058

## ආණ්ඩුවේ නිවේදන

අංකය : 543 ඊ/141 ඩී (II කොටස).

මෙයට ඇතුළත් උපලේඛනයෙහි II වැනි තීරයෙහි නියමිත දෙපාර්තමේන්තුවෙහි එයට අනුරූපව I වැනි තීරයෙහි නිශමිත එක් එක් තනතුර දරන හැම තැනැත්තකුම ඒ තනතුරට පත්කරනු ලැබූ දිනයෙහි සිට, විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තකු බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ.

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962, අගෝස්තු 15 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| ලේකම් .. .. .. .. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| උප ලේකම් .. .. .. .. | |
| පාලක .. .. .. .. | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය පාලක .. .. .. | |

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| අධ්‍යක්ෂ | ජාතික ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුව |
| ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | |
| පර්යේෂණ නිලධාරි | |
| පාලන සහකාරවරු | |
| පුස්තකාලයාධිපති | |
| සංඛ්‍යාලේඛන සමීක්ෂණ නිලධාරි | |
| කසළ ශෝධක හා උද්‍යාන කම්කරු | |
| ආයතන පාලක | මහා භාණ්ඩාගාරය |
| සහකාර ආයතන පාලකවරු | |
| සැපයීම්, සේවක සංඛ්‍යා හා මුදල් පාලක | |
| සැපයීම් හා සේවක සංඛ්‍යා සහකාර පාලක | |
| අධ්‍යක්ෂ, සංවිධාන හා ක්‍රම | |
| කොටඨාශය | |
| සහකාර අධ්‍යක්ෂ | |
| ප්‍රධාන රේගු අයකැමි | රේගු දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය රේගු අයකැමි | |
| අතිරේක ගොඩබෑම් සමීක්ෂක හා සහකාර රේගු අයකැමි | |
| කොළඹ ගොඩබෑම් සමීක්ෂක | |
| කොළඹ දිස්ත්‍රික් උසාවියේ පාලන ලේකම් | දිස්ත්‍රික් උසාවි |
| උද්‍යාන කම්කරු හා අර්ධකාලීන මුරකරු (පානදුරේ) | |
| කොළඹ නියෝජ්‍ය පිස්කල් | පිස්කල් දෙපාර්තමේන්තුව |
| ගබඩා භාරකරු | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව |
| රෙජිස්ට්‍රාර් ජනරාල් | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |
| අධ්‍යක්ෂ | ග්‍රාම සංවර්ධන සහ ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුව |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | |
| කොමසාරිස් | ජාතික නිවාස දෙපාර්තමේන්තුව |
| අධිකාරි ඉංජිනේරු | |
| අධ්‍යක්ෂ | සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව |
| කාර්යාල සහකාර | සමාජ සේවා දෙපාර්තමේන්තු |
| ඉඩම් කොමසාරිස් | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් | |
| සහකාර ඉඩම් කොමසාරිස්වරු | |
| ජනපද නිලධාරීන්ගේ පණිවිඩකරුවන් | |
| සහකාර නිරවුල් කිරීමේ නිලධාරීන් | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| අධ්‍යක්ෂ | ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | |
| සහකාර අධ්‍යක්ෂවරු | |
| කාර්යාල සහකාර | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| සහකාර පස් රසඥවරු | |
| කොමසාරිස් | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය වරාය කොමසාරිස් | කොළඹ වරාය කොමිෂන් සභාව |
| කොමසාරිස් | මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තුව |
| මෝටර්වාහන රෙජිස්ට්‍රාර් හා මෝටර් ගමනාගමන නියෝජ්‍ය කොමසාරිස් | |
| ප්‍රධාන පාලක නිලධාරි | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| පාලක නිලධාරීන් | |
| මැහුම් කාරියන් | |
| වැඩපොළ උපදේශක, ලාදුරු රෝහල | |
| සහකාර පුස්තකාලයාධිපති | ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව |
| හෙදි සහෝදරියන් | |
| රෝහල් ආහාර ගබඩාකාරිය | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| පාලක සහකාරවරු | |
| කාර්යාල සහකාර | |
| අධ්‍යක්ෂ ජනරාල් | ගුවන් විදුලි දෙපාර්තමේන්තුව |
| ගුවන් විදුලි මිකැනික්වරු | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |
| ආහාර කොමසාරිස් හා ආහාර සැපයීමේ අධ්‍යක්ෂ | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය ආහාර කොමසාරිස් හා ආහාර සැපයීමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ | |
| නියෝජ්‍ය ආහාර කොමසාරිස් හා නියෝජ්‍ය ආහාර පාලක | |
| කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| නියෝජ්‍ය කොමසාරිස් (පාලන) | |
| පාලන සහකාර | අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව |
| පාලක | ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව |
| ප්‍රධාන පාලක නිලධාරි | දුම්රිය දෙපාර්තමේන්තුව |
| පරීක්ෂකවරු, විශෙෂ I,II, හා III පෙළ | |
| ලයින්මන්වරු I හා II පෙළ | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව |
| කොමසාරිස් | වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව |
| සැලසුම් කාර්යාල සහකාරවරු | නගර සහ ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව |

8–1052

අංකය : 543ඊ/141ඕ (II කොටස)

මෙහි පහත නියමිත තනතුරු දරන්නන් විශ්‍රාම වැටුප් වලට හිමිකම් ඇත්තන් බව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ :—

අමාත්‍යාංශවල සහකාර ලේකම්වරු

අමාත්‍යාංශවල කාර්යාල සහකාරවරු

ආණ්ඩුවේ ඒජන්තවරු

සහකාර ඒජන්තවරු

අතිරේක සහකාර ඒජන්තවරු

ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ කාර්යාල සහකාරවරු.

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962, අගෝස්තු 15 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

8-1051/1

---

අංකය : 543ඊ/141ඕ (II කොටස)

මෙහි පහත නියමිත තනතුරු දරන්නන් විශ්‍රාම වැටුප් වලට හිමිකම් ඇත්තන් බව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල, 2 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ:

අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**කාර්මික අධ්‍යාපන ශාඛාව—ගබඩාව**

ගබඩා භාරකරුවන් (තනතුරු 2 යි)

**ස්වදේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන දෙපාර්තමේන්තුව**

කම්කරු (ඖෂධාගාර) (තනතුරු 61 යි)

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962, අගෝස්තු 15 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

8-1051/2

---

අංකය : 543ඊ/141ඕ (II කොටස)

මෙහි පහත නියමිත තනතුරු දරන්නන් විශ්‍රාම වැටුප්වලට හිමිකම් ඇත්තන් බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ :—

**අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ**

කාර්යාල සහකාර (එල්. ඕ. එච්. ද සිල්වා මහතා විසින් දරන අතර)

**ගොවිජන සේවා දෙපාර්තමේන්තුව**

වගාරක්ෂණ පරීක්ෂකයින් :

(එම්. කේ. ඒ. අසීස්,
ඕ. එස්. ජයසේකර සහ
ඒ. එස්. කරාලසිංහම් යන මහතුන් විසින් දරන අතර)

**සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව**

ටයිප්කරු (එස්. පී. ප්‍රනාන්දු මහතා විසින් දරන අතර)

**ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව**

කම්මාන්ත ශාලා ලිපිකරු (ඩබ්ලිව්. පී. වීරතුංග මහතා විසින් දරන අතර)

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962, අගෝස්තු 15 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

8-1051/3

---

අංක : 551ඊ931/3 ඕඕ.

මෙහි පහත නියමිත තනතුර දරන්නා 1962 ජූනි 1 වැනි දින සිට විශ්‍රාම වැටුප් වලට හිමිකම් ඇත්තකු බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ.

**විදුලි දෙපාර්තමේන්තුව**

විදුලි ගබඩාභාරකරු, II (ආ) පියවර, ජලවිදුලි යෝජනා ක්‍රමය (සී. ඒ. ගුණවර්ධන මහතා දරණ අතර)

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

8-1095

---

## බන්ධනාගාර ආඥා පනත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පනතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලයක ට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය **සෝදිසි කොමිටියේ සාමාජිකයන්** වශයෙන්, **කර්මාන්ත, සවදේශ** හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

අත්සන් කළේ :————,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ සථිර ලේකම් වෙනුවටය.

1962 අගෝස්තු 21 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| මීගමුවේ තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලීය බන්ධනාගාරය. | සී. එම්. ප්‍රනාන්දු මහතා |

8-1053

---

## බන්ධනාගාර ආඥා පනත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පනතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාල යකට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රදේශීය **සෝදිසි කොමිටියේ සාමාජිකයන්** වශයෙන්, **කර්මාන්ත, සවදේශ** හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

අත්සන් කළේ :————,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවටය.

1962 අගෝස්තු 21 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| කුණ්ඩසාලේ එළිමහන් සිරකඳවුර | 1. ජේ. උඩගම මහතා<br>2. ඇම්. පී. අබේරත්න මහතා. |

8-1093

---

## පඩිපාලක සභා ආඥාපනත

**නිවේදනයයි**

ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් හැටියට 1962 මාර්තු 11 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු හා ජනසතු සේවා ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා.

1962 අගෝස්තු මස 22 වන දින,
කොළඹ දී ය.

නම නියමකොට පත් කරනු ලබන සාමාජිකයෝ

1. ඇල්. එච්. සුමනදාස මහතා
2. එච්. සමරනායක මහතා
3. සී. සූරියකුමාරන් මහතා

සේව්‍ය නියෝජිතවරු

1. ඇම්. එච්. ආර්. ඇස්ටබරි මහතා
2. ආර්. පැට්සන් මහතා
3. ජේ. ඩබ්ලිව්. පී. මිඩ්ල්මිස් මහතා
4. වී. හටන් මහතා
5. ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මහතා
6. විමලව් ඒ. වනිගසිංහ මහතා
7. ෆ්‍රැන්සිස් වනිගසේකර මහතා
8. ඩී. ජේසන් ප්‍රනාන්දු මහතා
9. සී. ජේ. ලොජී මහතා
10. ඇල්. ඒ. වනිගසිංහ මහතා

සේවක නියෝජිතවරු

1. එච්. සී. වෙඩිවර්ධන මහතා
2. කේ. පී. රාජපක්ෂ මහතා
3. වෝල්ටර් ජෝතිපාල මහතා
4. ඇස්. කේ. ඇල්බට් මහතා
5. සෝමසිරි මීපාවල මහතා
6. විලියම් කල්ලැගොඩ මහතා
7. ඇන්. සන්මුගදාසන් මහතා
8. ඩී. ඇස්. ෆොන්සේකා මහතා
9. ජී. පී. පෙරේරා මහතා
10. දිනදාස අභයගමගේ මහතා

8-1145

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥාපනතේ (136 වෙනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(1) ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට, පඩිපාලක සභා ආඥාපනතේ 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවා සේ සැලකෙන, වී. ඩී. පී. ප්‍රනාන්දු මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු වශයෙන් පෙනී සිටීමට ජේ. ඩබ්ලිව්. බී. පෙරේරා මහතා ;

(2) ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට පඩිපාලක සභා ආඥාපනතේ 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවාසේ සැලකෙන, කේ. එම්. පී. රාජපක්ෂ මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට, ඩබ්ලිව්. ඒ. ධම්මසේන මහතා ; සහ

(3) ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ ආර්. ඒ. සරණපාල මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේවක නියෝජිතයෙකු ලෙස පෙනී සිටීමට එච්. සී. වෙඩිවර්ධන මහතා.

වී. ඇස්. ඇම්. ද මැල්,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශය.

1962 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

8-1185

---

## 1956 අංක 37 දරන ගාස්තු අයකරන රැකීරක්ෂා ආයතන පිළිබඳ පනත

කම්කරු හා ජනසතු සේවා ඇමතිවරයා විසින් 1956 අංක 37 දරන ගාස්තු අයකරන රැකීරක්ෂා ආයතන පිළිබඳ පනතේ 14 වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල පිට සකස් කරනු ලැබුවාවූත් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවාවූත් නියෝගයයි.

ඇම්. පී. ද ඉසැඩ් සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා ඇමති.

1962 ජූනි මස 18 වන දින,
කොළඹදීය.

### නියෝගය

වම් 1958 ජනවාරි මස 31 වන දින අංක 11,253 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1957 ගාස්තු අය කරන රැකීරක්ෂා ආයතන පිළිබඳ නියෝගමාලාව, එහි 5 වන නියෝගයේ (3) වන ඡේදයට පසුව ඊළඟටම මෙහි පහත දැක්වෙන්නා වූ ඡේද යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“ (4) සේව්‍යයකුට කම්කරුවකු සපයා දීම සඳහා එම සේව්‍යයාගෙන් රුපියල් පහළොවක ගාස්තුවක් අය කිරීමට ගාස්තු අය කරන රැකී රක්ෂා ආයතනයකට පුළුවන.

එසේ ද වුවත් එම ආයතනයෙන් සපයා දෙනු ලැබුවා වූ කම්කරුවා එසේ සපයනු ලැබූ දින සිට හය මාසයක කාල පරිච්ඡේදයක් ඇතුළත දී ඔහුගේ හෝ ඇගේ සිය කැමැත්තෙන් එම සේව්‍යයාගේ සේවයෙන් අස්වී ගියහොත්, එවිට එම ආයතනය—

(අ) එම සේව්‍යයාට රුපියල් දහයක මුදලක් ආපසු ගෙවිය යුතු වන්නේ ය ; නැතහොත්

(ආ වෙන කිසිදු ගාස්තුවක් අය නොකොට එම සේව්‍යයාට වෙන කම්කරුවකු සපයා දිය යුතු වන්නේ ය.

(5) කම්කරුවකුට රක්ෂාව ලබා දීම සඳහා එම කම්කරුවාගෙන් රුපියල් දෙකකුත් සත පණහක ගාස්තුවක් අය කිරීමට ගාස්තු අය කරන රැකීරක්ෂා ආයතනයකට පුළුවන. ”

8-1107

---

## (106 වෙනි අධිකාරය වන) ස්වදේශීය වෛද්‍ය ආඥා පනත

(106 වෙනි අධිකාරය වන) ස්වදේශීය වෛද්‍ය ආඥා පණතෙහි 3 (4) වෙනි වගන්තිය යටතේ ස්වදේශීය වෛද්‍යෝපදේශක සභාවේ සාමාජිකයකු වන වෛද්‍යාචාර්ය එම්. සී. චන්ද්‍රසේන මහතා 1962 අගෝස්තු මස 22 වෙනි දින සිට නැවත වරක් තෙවසක කාලයකට ස්වදේශීය වෛද්‍යෝපදේශක සභාවේ සාමාජිකයකු මෙසේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබිය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 18 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

8-1089

---

## 1954 අංක 37 දරන ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 අගෝස්තු 10 වැනි දින දීය,
කොළඹ 2.

### උපලේඛනය I

බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලය උතුර “ අ ” ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, අංක 73 දරණ ඒතුකාල් ගම්මුලාදෑනි වසමේ පිහිටි මනුවෙල් අන්නාවී තෝට්ම් නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 1, රූඩ් 1 පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : අනනාසියා කෲස්ට අයිති ඉඩම් ; නැගෙනහිරට : පුද්ගලික ඉඩම් ; දකුණට : අඩි හයක් පළලැති පාර ; බස්නාහිරට : මීගමුව-කොච්චිකඩේ අළුත් පාර.

### උපලේඛනය II

බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලය උතුර “ අ ” ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, අංක 73 දරණ ඒතුකාල් ගම්මුලාදෑනි වසමේ පිහිටි මනුවෙල් අන්නාවී තෝට්ම් නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කරයක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : අඩි හයක් පළලැති අඩි පාර ; නැගෙනහිරට : හෙන්ද්‍රික් ප්‍රනාන්දුට සහ රොස්ලින් කෲස්ට අයිති ඉඩම් ; දකුණට : දොස්තර හෙක්ටර් ප්‍රනාන්දුට අයිති ඉඩම් ; බස්නාහිරට : මීගමුව-කොච්චිකඩේ අළුත් පාර.

## උපලේඛනය III

ඉහත සඳහන් ඉඩම් කොටස් දෙක මැදින් වැටී ඇති අඩි හයක් පළල සහ මීගමුව-කොච්චිකඩේ අළුත් පාරේ සිට මෙම ඉඩම් කොටස් දෙකේ නැගෙනහිර මායිම දක්වා දික්වූ කරත්ත පාර උඩින් පරවශතාවයක් ද අත්පත් කර ගත යුතුය.

8-1057

---

ඇල්.ඩී.—බී. 80/44.

### පඩිපාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

136 වැනි අධිකාරය වන පඩිපාලක සභා ආඥාපනතේ 20, 23, 24 සහ 25 යන වගන්තිවලින් පැවරී ඇති බලතල පිට මේයට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන තීරණය ඇති කිරීමට තමන් අදහස් කරන බව අයිස් හා සිසිල් බීම සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව එම ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරයි.

යෝජිත මෙම තීරණයන්ට විරුද්ධව කීමට ඇති කරුණු 1962 සැප්තැම්බර් මස 21 වෙනි දින දහවල් 12 දක්වා පඩිපාලක සභාවේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

එබඳු සෑම විරුද්ධත්වයක් එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශනයක් සහිත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

එන්. ඇල්. අබේවීර,
සභාපති.
අයිස් හා සිසිල් බීම සෑදීමේ කර්මාන්තයේ
පඩිපාලක සභාව.

1962 අගෝස්තු මස 27 වන දින,
කොළඹ දීය.

## උපලේඛනය

### I වන කොටස

#### 20 (2) (ආ) වෙනි වගන්තිය යටතේ විධානය

1. කම්කරු කොමසාරිස්වරයා විසින් විශේෂ දීමනාව ගණන් බලා මාස්පතා ප්‍රසිද්ධ කළ යුතුය.

2. කවර මාසයක වුවත් වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු විශේෂ දීමනාව ගණන් බැලිය යුත්තේ එම මාසයට පෙරාතුවම ගත වූ මාසය සඳහා වූ ජීවන වියදම් අංකය පදනම් කරගෙනය.

#### වැඩ කරන සාමාන්‍ය දවසක් යන්නෙහි අර්ථ නිරූපණය (24 වෙනි වගන්තිය)

1. අයිස් සෑදීමේ නියුක්ත කම්කරුවන් නොවන, අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තයේ කම්කරුවන් සඳහා වැඩ කරන සාමාන්‍ය දවසකට (කෑම ගැනීම සඳහා පැයක් ඇතුළුව) අයත් පැ ගණන වන්නේ :—
   (අ) සෙනසුරාදා නොවන යම් දවසකට ... පැය 9 කි.
   (ආ) සෙනසුරාදාවකට ... ... පැය 6 කි.

2. අයිස් සෑදීමේ නියුක්ත කම්කරුවන් සඳහා වැඩ කරන සාමාන්‍ය දවසකට (කෑම ගැනීමට පැයක් ඇතුළුව) අයත් පැ ගණන වන්නේ :—
   (අ) සතියේ ඕනෑම පස් දවසකට ... පැය 9 කි.
   (ආ) සතියේ එක් දවසකට ... ... පැය 6 කි.

### II වන කොටස

කාල මිම්මේ වැඩවලට ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි වූ :—
(1) මූලික ප්‍රමාණයකින් ; සහ
(2) විශේෂ දීමනාවකින් යුක්ත විය යුතුය :—

| (1) කම්කරුවාගේ පන්තිය | (2) වැඩකරන සාමාන්‍ය දවසකට මූලික ප්‍රමාණය | (3) කවර මාසයක වුව වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු විශේෂ දීමනාවේ ප්‍රමාණය (අ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·1 නම් විශේෂ දීමනාව වන්නේ— | (ආ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·0 නම් විශේෂ දීමනාව වන්නේ— | (ඇ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·1 ට වැඩිවූ විට හෝ 100·0ට අඩුවූ විට එය 100·1ට ඉහළ ගෙනයන හෝ 100·0ට පහළ ගෙන යන හෝ සෑම අංක 1·8ටෙ සම්පූර්ණ ඒකකයකට (ඒකකයේ ඛණ්ඩ ගණන් ගනු නොලැබේ) පහත දක්වෙන ප්‍රමාණයන් අනුව පිළිවෙළින් මෙහි පහත 1 වන හා 2 වන වක්‍රයන්හි නිදර්ශිත පරිද්දෙන් ගණන් බලා එන මුදලකින් උචිත පරිද්දෙන් මීට ප්‍රථම 3 (අ) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය වැඩිකළ යුතු හෝ 3 (ආ) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය අඩු කළ යුතු හෝ වන්නේය |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| I වෙනි ශ්‍රෙණිය— කංකානම්වරු, ප්‍රධාන සිරප් සාදන්නෝ, ජලපවිත්‍ර යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, කැන් සාදන්නෝ, වඩුවෝ, පුරවන්නෝ (ස්වයංකාරී), හුරිවැරදි බලන්නෝ ... | 2 0 ... | 2 10 ... | 2 7 ... | 0 3 |
| II වෙනි ශ්‍රෙණිය— කැන් අළුත්වැඩියා කරන්නෝ, අංගාරිකාම්ල වායු පරිපාලනය කරන්නෝ, සහකාර සිරප් සාදන්නෝ, සිරපර්වරු, ක්‍රවුනර්වරු, ශුද්ධබෝතල් පිරික්සන්නෝ, කාබනේටර් ඔපරේටර්වරු, නිෂ්පාදිතයන් ගණන් කරන්නෝ, පුරවන්නෝ (අතින්), ලේබල් කරන්නෝ (ස්වයංකාරී), ශෝධනයන්ගෙන් බෝතල් ඉවත් කරන්නෝ, ස්වයංකාරී යන්ත්‍රවලින් සිසිල්බීම නිපදවීමේ නියුක්ත වෙනත් කම්කරුවෝ, අයිස් තෙළන්නෝ | 1 65 ... | 2 10 ... | 2 7 ... | 0 3 |
| III වෙනි ශ්‍රෙණිය— අයිස් අසුරන්නෝ, අයිස් පැක්කරන්නෝ, අයිස් පටවන්නෝ, සිරප් කාමර කම්කරුවෝ, බෝතල් මිටි කඩන්නෝ, බෝතල් තෝරන්නෝ, නොහොත් ශුද්ධ කරන්නෝ, ශෝධනයට බෝතල් දමන්නෝ, පෙට්ටි පුරවන්නෝ, බෝතල් පැක්කරන්නෝ, ශුද්ධ කරන්නෝ නොහොත් අතුගාන්නෝ, බෝතල් අතින් ශුද්ධ කරන්නෝ, පෙට්ටි ගෙනයන්නෝ නොහොත් අට්ටි ගසන්නෝ, ගබඩා කම්කරුවෝ, ලේබල් කරන්නෝ (අතින්), රථවලට බඩු පටවන්නෝ ... | 1 40 ... | 2 0 ... | 1 97 ... | 0 3 |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

රේ. ආ. 40 අ.

## 1938 අංක 51 දරන සමාගම් ආඥා පනත

### 277 (5) වගන්තිය යටතේ සීමාසහිත ෂෙල් මෝටර්ස් නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරන සමාගම් ආඥා පනතේ විධි විධාන යටතේ 53.5.22 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ෂෙල් මෝටර්ස් ව්‍යාපාරික කටයුතුවල නිරත වී නැති බව, නොහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින් ද,

එසේ නොකිරීමට හේතු නොදක්වූවහොත්, එ දින සිට තුන් මාසයක් ඉකුත් වූ විට, සීමාසහිත ෂෙල් මෝටර්ස් නම රෙජිස්ටරයෙන් කපා හරින බවට 1960. 12. 2 දින අංක 12,241 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් 60.11.25 දින දරන දැන්වීමක් පළ කරන ලද හෙයින් ද,

සීමාසහිත ෂෙල් මෝටර්ස් ඉහත කී තුන් මාසයේ කාල සීමාව තුළ එසේ නොකිරීමට හේතු දක්වා නොමැති බැවින් ද,

අද දින, සීමාසහිත ෂෙල් මෝටර්ස් නම සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින ලද බව ද, ඉහත කී සමාගම විසුරුවා හරින ලද බවද, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරන සමාගම් ආඥා පනතේ 277 (5) වැනි වගන්තිය යටතේ, මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 අගෝස්තු මස 17 දින,
කොළඹ, වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේදීය.

8-1038

---

ඇල්. ඩී.—බී. 23/50

## උකස් පනත

වාණිජ අධ්‍යක්ෂ, ගිනිගේ රිචර්ඩ් වෝල්ටර් ද සිල්වා වන මම 89 අධිකාරය වන උකස් පනතේ අංක 3 (ඇ) සහ 114 (2) දරන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සීමාසහිත කොලට් පිරිනැන්ස් සමාගම, එම පනතේ කාර්යයන් සඳහා පිළිගත් ණයදෙන ව්‍යාපාරයක් වශයෙන්, මෙම නිවේදනයෙන් ප්‍රකාශයට පමුණුවා සිටිමි.

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
වාණිජ අධ්‍යක්ෂ.

1962 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

8-1050

---

## ප්‍රකාශනයයි

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ කන්ද පහල කෝරලයේ "ගවයින් අතර රක්තාශ්‍රව (හෙමරජික් සෙප්ටිසීමියා)" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙසින් ප්‍රකාශ කරමි :—

උතුරට : හීන් ගඟ (මාතලේ දිස්ත්‍රික්ක මායිම) ; දකුණට : නැගෙනහිරට සහ බස්නාහිර ගම්පහ කෝරළේ මායිම ; නැගෙනහිරට : මහවැලි ගඟ ; බස්නාහිරට : ගන්දෙක කෝරළේ මායිම.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගව යන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර අළුත් නුවර පශු වෛද්‍ය තැන ගෙන් හෝ උඩදුම්බර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කායඹාලයෙන් ලබාගත හැකි බව මෙසින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන.

1962 අගෝස්තු 23 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායඹාලයේ දී ය.

8-1151

---

## මධ්‍යම කොට්ඨාශය—නුවරඑළිය දිස්ත්‍රික්කය

### රාසිංගොල්ල-බෝලගන්දාවල පාරේ අංක 1/4 දරණ පාලම නැවත සෑදීම

ඉහත සඳහන් පාලම නැවත සෑදීමේ බලාපොරොත්තුවෙන් එය සියලුම රථ වාහන සඳහා 1962.8.1 දින සිට 1962.10.31 දක්වා වසා තබනු ඇත.

මේ හැරුණු විට වෙනත් මාර්ගයක් නැත.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1962 අගෝස්තු 20.

8-1250

---

## රථ වාහන ගමනා ගමනයට බාධා

### කොස්ලන්ද දිස්ත්‍රික්කයේ කොළඹ-රත්නපුර-වැල්ලවාය මඩකලපුව පාරේ අංක 152/5 දරණ පාලම

ඉහත සඳහන් පාලමෙන් ගමන් කළ හැකි වාහන වල මුළු බර ප්‍රමාණය 62.9.3 වෙනි දින සිට නැවත දන්වන තුරු ටොන් තුන (3) දක්වා අඩුකර ඇති බව මහාජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. ඇම්. ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අගෝස්තු මස 23 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේදීය.

8-1111

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### උතුරු මැද කොට්ඨාශය—නාලන්ද දිස්ත්‍රික්කය

"සී" පංක්තියට අයත් මාර්ගයක් වන පල්ලෙපොල-වහකෝට්ටෙ පාරේ අංක 7/5 දරණ පාලමට හදිසි අළුත්වැඩියා කිරීමේ බලාපොරොත්තුවෙන් 62.9.16 සහ 62.9.30 වෙනි දින දෙකම ඇතුළත්ව, මෙම පාලම 62.9.16 වෙනි දින සිට 62.9.30 දින දක්වා සියළුම රථ වාහන උදෙසා වසා තබනු ලබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

මිල්ලෑවාන සහ මාදිපොල බලායන රථ වාහන "බී" පංක්තියට අයත් (බී. 35 දරණ) මාර්ගයක් වන පලාපත්වෙල-ගලේවෙල මාර්ගයේ පල්ලෙපොල සහ තල්වත්ත මංසන්ධි වලින් හැරී යා යුතුයි.

වහකෝට්ටෙන් හැරීයන රථ වාහන පාලම ඇති ස්ථානය දක්වා ගොස් ආපසු පැමිණිය යුතුයි.

එච්. කේ. මෙල්සන් ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1962.8.24.

8-1204/1

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### උතුරු මැද කොට්ඨාශය—නාලන්ද දිස්ත්‍රික්කය

"සී" පංක්තියට අයත් මාර්ගයක් වන පල්ලෙපොල-වහකෝට්ටෙ පාරේ අංක 3/8 දරණ පාලමට හදිසි අළුත්වැඩියා කිරීම් බලාපොරොත්තුවෙන් 62.9.1 සහ 62.9.15 වෙනි දින දෙකම ඇතුළත්ව, මෙම පාලම සියළුම රථ වාහන උදෙසා 62.9.1 වෙනි දින සිට 62.9.15 වෙනි දින දක්වා වසා තබනු ලබන බව මහ ජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

මිල්ලවාන සහ මාදිපොල බලා යන රථ වාහන "බී" පංක්තියට අයත් (බී. 35 දරණ) මාර්ගයක් වන පලාපත්වෙල-ගලේවෙල මාර්ගයේ තල්වත්ත සහ වහකෝට්ටෙ මංසන්ධිවලින් හැරී යා යුතුයි.

පල්ලෙපොල මංසන්ධියෙන් එන රථ වාහන පාලම ඇති ස්ථානය දක්වා ගොස් ආපසු පැමිණිය යුතුයි.

එච්. කේ. මෙල්සන් ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට,

රජයේ වැඩ කාර්යාලය,
කොළඹ 1,
1962.8.24.

8-1204/2

## දැන්වීමයි

හිඟුරක්ගොඩ තානායම 62.9.5 වෙනි දින සිට 62.9.20 වෙනි දින දක්වා (මෙම දින දෙකද ඇතුළුව) අළුත්වැඩියා කිරීම සඳහා වසා තබනවා ඇත. එබැවින් එම කාලය තුළ මෙම තානායම මහජනයාගේ ප්‍රයෝජනය සඳහා ලබාගැනීමට නුපුළුවන් බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. කන්දසාමි,
ආණ්ඩුවේ දිසාපති වෙනුවට,
පොළොන්නරුව දිස්ත්‍රික්කය.

1962 අගෝස්තු මස 25 වෙනි දින,
පොළොන්නරුවේ දිසාපති කාර්‍යාලයේදීය.

8–1292

---

## වන්දනාගමන් ආඥාපනත

**සින්නත් ඔ සින්නරවේලායුදසාමි කෝවිල් උත්සවය—1962 මඩකලපු දිස්ත්‍රික්කය**

යථෝක්ත උත්සවය 1962. 8. 31 වෙනි දින පටන්ගෙන 1962. සැප්තැම්බර් මස 15 වෙනි දින දක්වා පැවැත්වෙන බව එකී උත්සවය සඳහා පැමිණෙන අයවලුන්ගේ සහ අනිකුත් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1952 අගෝස්තු මස 15 වෙනි දින අංක 10,434 දරණ ලංකාණ්ඩුවේ ගැසට් නිවේදනයෙහි සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේදී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේත් අනිකුත් අයගේත් අවදානය මෙයින් යොමුකරවමි.

ඩී. අලුවිහාරෙ,
දිසාපති මඩකලපු දිස්ත්‍රික්කය.

දිසාපති කාර්‍යාලය,
මඩකලපුව, 62. 8. 24.

8–1310

## "සුරාබදු ආඥාපණත" පිළිබඳ දැන්වීම්

ඇල්. ඕ.—බී 36/36
සු. කො.—ඇල් ඕ/ඩබ්ලිව්/437.

### සුරාබදු ආඥාපනත

**අංක 505 දරන සුරාබදු නිවේදනය**

(52 වෙනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 2 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති, මෛත්‍රීපාල සේනානායක වන මම තාලවර්ගයේ ගසකින් ලබාගන්නා ඕනෑම ස්වාභාවික පලදාවකින් හෝ වෙනත් පැලෑටියකින් (රා හෝ යම් ධාන්‍යයකින් සාදන ලද වෙනත් මත්පැනක් හැර) සාදනු ලැබ, මද්‍යසාරය සියයට හතරකට වඩා අඩංගු වන්නාවූ හා 1936 නොවැම්බර් මස 13 වෙනි දිනය හා අංක 8,256 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 298 දරන සුරාබදු නිවේදනයේ නියමකර ඇති පරිදි, පෙරීමේ ක්‍රමය හැර වෙනත් යම් ක්‍රමයකින් සාදනු ලබන මත්පැන්, එකී ආඥාපනතේ අභිප්‍රාය අනුව, රටබීම වශයෙන් සලකනු ලැබිය යුතු බැව් මෙයින් ප්‍රකාශ කරමි.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1962.7.24 වෙනි දින,
කොළඹදීය.

8–1104

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

---

කාංචී වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි